**TORONTO MAHA VIHARA SCHOLARSHIP FOUNDATION**
(Registered Non Governmental Organization, Reg.No: FL-128504)

## 2016 ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීමයි

ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව (Toronto Mahavihara Scholarship Foundation) පදනම ලංකාවේ 2004 සුනාමියෙන් විපතට පත්වූ ශිෂ්‍යය/ශිෂ්‍යාවන් සඳහා ප්‍රධානය කරනලද පළමු වන ශිෂ්‍යත්ව වැඩ සටහන 2014 දෙසැම්බර් මස අවසාන විය. එම ශිෂ්‍යත්ව වැඩ සටහනේ දෙවන අදියර 2016 මුලදී පටන් ගැනීම සඳහා දැන් ඉල්ලුම් පත් කැඳවනු ලබයි. ඒ සඳහා මූලික සුදුසුකම් පහත සඳහන් වේ. ඉල්ලුම් පත් නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසුව ඒවා පහත සඳහන් අහංගම ලිපිනයට **2016 මාර්තු 31** දාට පෙර ලැබෙන පරිදි තැපැල් කර එවන්න.

(1) පළමු වන ශිෂ්‍යත්ව වැඩ සටහනේ කළ පරිදි ශිෂ්‍යත්ව ප්‍රධානය කරනු ලබන්නේ පහත සඳහන් දිස්ත්‍රික්කවල පාසැල් වල ඉගෙන ගන්නා ශිෂ්‍යය/ශිෂ්‍යාවන් සඳහා පමණි. එම දිස්ත්‍රික්ක: අම්පාර, මඩකලපුව, ගාල්ල, හම්බන්තොට, මාතර හා ත්‍රිකුණාමලය.

(2) 2016 ජනවාරි මාසය වනවිට 8 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන, රජයේ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ධාරීන් විය යුතුය.

(3) ඉල්ලුම් කරුවන් ගේ පසුගිය වර්ෂයේ එනම් 7 වන ශ්‍රේණියේ වාර්ෂික සාමාන්‍ය අධ්‍යාපනික ප්‍රගතිය (විෂයන් 10) අවම වශයෙන් 65% විය යුතුය.

ශිෂ්‍යත්ව ධාරීන් තේරීමේදී ඉල්ලුම් කරුවන් ගේ පවුලේ අදායම සහ විෂයයන්ට බාහිර වූ ක්‍රියාකාරකම් (ක්‍රීඩා, ස්වේච්ඡා සේවා ආදිය) ද සැලකිල්ලට ගනු ලැබේ.

## අයදුම් පත් පිරවීම සඳහා උපදෙස්

(1) අයදුම් පත් පහත දැක්වෙන පරිදි ආකෘතිපත්‍ර දෙකකින් සමන් විත වේ. එම ආකෘතිපත්‍ර වල සඳහන් සියලු විස්තර සියල්ලම කිසි අඩුපාඩුවක් නොමැතිවද හිස් තැන් නැතිවද සම්පූර්ණ කල යුතුය. අසම්පූර්ණ ඉල්ලුම් පත් කිසිම හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ. අවශ්‍ය නම් කරුණු පැහැදිලි කිරීම සඳහා සටහනක් අයදුම් පතට අමුණා එවිය හැක.

(2) ආකෘතිපත්‍ර දෙක:

(i) "A" ආකෘතිපත්‍රය - අයදුම් කරුගේ පුද්ගලික තොරතුරු
(ii) "B" ආකෘතිපත්‍රය - අයදුම් කරුගේ අධ්‍යාපනික තොරතුරු

## (3) "A" ආකෘතිපත්‍රය - අයදුම් කරුගේ පුද්ගලික තොරතුරු

(i) අයදුම් කරුගේ නම උප්පැන්න සහතිකයේ සහ පාසැලේ ලියාපදිංචි නම හා සමාන විය යුතුය. නමේ මුල් මැද හා අවසාන කොටස් ඒ පිළිවෙලින් සඳහන් කල යුතුය.

(ii) ලිපිනය ඔබට දැනට ලියුම් ලැබෙන ලිපිනය විය යුතුය. වැරදි ලිපිනයක් සඳහන් කලොත් ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමෙන් එවන ලිපි නොලැබී යනු ඇත. පසු කලක ලිපිනය වෙනස්වුවහොත් අලුත් ලිපිනය වහා ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමට දැන්විය යුතුය.

(iii) පාසැලේ නම අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් දැනට ඉගෙන ගන්නා පාසලේ සම්පුර්ණ නම විය යුතුය. එහි සම්පුර්ණ ලිපිනය ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමට ලියුම් ගනුදෙනු කිරීම සඳහා අවශ්‍යය.

(iv) අයදුම් කරුගේ පවුලේ අදායම, අයදුම් කරුගේආර්ථික තත්වය තුලනය කිරීම සඳහා අවශ්‍යය. මෙම විස්තරය ග්‍රාම නිලධාරී මහතා සහ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් සහතික කල යුතුවේ.

(v) මෙම ආකෘතිපත්‍රයේ අයදුම් කරුගේ පුද්ගලික තොරතුරු, පාසැලේ තොරතුරු සහ පවුලේ තොරතුරු සම්පුර්ණ කිරීමෙන් පසු අයදුම් කරුගේ දෙමව්පියන් ගෙන් කෙනෙක් හෝ භාරකරු විසින් එම සත්‍ය තොරතුරු ලෙස සහතික කල යුතුය.

(vi) ඉන් පසුව එම විස්තර ග්‍රාම නිලධාරී මහතා සහ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් සහතික කල යුතුවේ.

## (4) "B" ආකෘතිපත්‍රය - අයදුම් කරුගේ අධ්‍යාපනික තොරතුරු

(i) අයදුම් කරුගේ නම උප්පැන්න සහතිකයේ සහ පාසැලේ ලියාපදිංචි නම හා සමාන විය යුතුය. නමේ මුල් මැද හා අවසාන කොටස් ඒ පිළිවෙලින් සඳහන් කල යුතුය.

(ii) ලිපිනය ඔබට දැනට ලියුම් ලැබෙන ලිපිනය විය යුතුය. වැරදි ලිපිනයක් සඳහන් කලොත් ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමෙන් එවන ලිපි

නොලැබී යනු ඇත. පසු කලක ලිපිනය වෙනස්වුවහොත් අලුත් ලිපිනය වහා ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමට දැන්විය යුතුය.

(iii) පාසැලේ නම අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් දැනට ඉගෙන ගන්නා පාසලේ සම්පූර්ණ නම විය යුතුය. එහි සම්පූර්ණ ලිපිනය ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනමට ලියුම් ගනුදෙනු කිරීම සඳහා අවශ්‍යය.

(iv) ශිෂ්‍යා 2016 වර්ෂයේ ජනවාරි මාසයේ ශිෂ්‍යා ඉගෙන ගන්නා ශ්‍රේණිය අවශ්‍යය.

(iv) 2015 වර්ෂයේ 7 වන ශ්‍රේණියේ වාර්ෂික සාමාන්‍ය අධ්‍යාපනික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස දැක්විය යුතුය. ඊට අදාල විෂයන් ගණනද සඳහන් කරන්න. මීට අමතරව පාසලේ වාර්ෂික ප්‍රගති වාර්තාවක පිටපතක් ද ඇමිණිය හැක.

(v) පෙරදී ශිෂ්‍යා වෙනත් පාසැලක අධ්‍යාපනය හැදෑරුවෙනම් එම පාසැලේ ලිපිනය සඳහන් කරන්න.

(vi) අයදුම් කරුගේ අධ්‍යාපනික තොරතුරු නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසුව එහි දක්වා ඇති විස්තර සත්‍ය බවට පන්තිය භාර ගුරු තුමා සහ ප්‍රධානාචාර්යතුමා විසින් අත්සන් කිරීමෙන් සහතික කල යුතුවේ. අතසනට යටින් පාසලේ මුද්‍රාව තැබිය යුතුය.

(5) අංක “A” හා “B” ආකෘතිපත්‍ර නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසුව ඒවා පහත සඳහන් අහංගම ලිපිනයට **2016 මාර්තු 31** දාට පෙර ලැබෙන පරිදි තැපැල් කර එවන්න.

ලිපිනය : ටොරොන්ටෝ මහාවිහාර ශිෂ්‍යත්ව පදනම, ජයසුමනාරාමය, ගොවියාපාන, අහංගම (ගාල්ල).